


*අම්මි රෝරේ රෙයියා*
*අප්පි රොරේ රෙයියා*
*නැළවුම් පොජ්ජෙන් පටෑරිලා*
*අම්මිල අප්පිල ඇත්තෝ*
*මොක්කිට වන්නියලැත්තෝ*
*යාදිනි පොජ්ජක මන්දො වෙලා*

අන්තර්ජාලය ඔස්සේ ලක්හඬ ගුවන්විදුලියට සවන්දෙන විට මේ අපූරු ගීතය මට ඇසුණා. ඒ වෙලාවේ මේ ගීතය ලියූ රචකයා කවුදැයි නිවේදකයා කී විට මගේ හිතට සියුම් සතුටක් දැනුණා. මම ඒ මොහොතේම මේ ගීතය ලියූ අපේ හිත මිත්‍ර සිසිර දිසානායක ට දුරකතන ඇමතුමක් දුන්නේ ඔහුට මගේ සතුට ප්‍රකාශ කරන්න. වැදි භාෂාව පාදක කරගනිමින් සිසිර අතින් ලියැවුණ මේ ගීතය අපේ කතාබහට පාදක වුණා.

**සිසිර ඇයි මෙවන් ගීතයක් ලියන්න අදහස් කළේ?**
ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණ දා ඉඳන් ඇබොරිජින් ජන ගායනා ඇසුරු කර ගනිමින් නිර්මාණයක් කරන්න මගේ හිතේ ආසාවක් තිබුණා. මේ අදහස මම තරුපති මුණසිංහ සොයුරාට කිව්වා. ඒ අනුව ආදි වාසී ගායනා ශෛලියට ඔහු විසින් තනුවක් නිර්මාණය කළා. ඒ තනුවට ඇහුම්කන් දෙන විට මට දැනුණේ මේ තනුව අපේ වැදි ගායනා ශෛලියට නෑකම් කියන බවක්. ඒ අනුව මම මේ තනුවට පද වැලක් ලිව්වා. තරුපති සමග සාකච්ඡා කර අවශ්‍ය වෙනස් කම් කරමින් පද වැල තවත් සංශෝධනය කළා. මේ ගීතය ඒ උත්සාහයේ අවසන් ප්‍රතිඵලයයි.

මේ ගීතය නිර්මාණය කරද්දි වැදි භාෂාව පිළිබඳ ලියවුණ පොත් පත් විශාල වශයෙන් කියවන්නත් මට සිදුවුණා.

**ඔබ අතින් ලියැවුණ බොහෝ ගීත වලට පාදක වුණේ ජනවහර. ජානක වික්‍රමසිංහ ගායනා කරන නුඹෙ සිරික්කියට ලයනල් රංවල ගේ ගම අවුලක්ඳක්ඳං වැනි ගී අපට සිහිපත් වෙනවා. ඒ අතරේ ළමා ගී කෙරෙහි යොමුවන්න ඔබට සිතුණෙ ඇයි?**
මම මෙයිට පෙරත් ළමා ගී විශාල ප්‍රමාණයක් ලියලා තියෙනවා. ඒ ගීත ලියවුණේ හුඟක් වෙලාවට ලක්හඬ ගුවන්විදුලියට ලයනල් රංවල මහත්මයාට සහ රූපවාහිනී නාලිකා වල අවශ්‍යතා සඳහා. ඔස්ට්‍රේලියාවට ආවට පස්සෙ ශීරෝමා ප්‍රනාන්දු මහත්මිය නිපදවූ -ඉතින් නිවුණාද ළය ගිණි" කියන ටෙලි නිර්මාණය සඳහා ගීතයක් ලියන්න මට ඉඩ ලැබුණා. මෙම ටෙලි නාට්‍යයට අතුරු මිතුරු නමින් මම ගීතයක් නිර්මාණය කළා. මේ ගීතය ඇසූ ඩෙන්සිල් ජයවීර සොයුරා මට ළමා ගීත සංගත




තැටියක් කරන ලෙස ආරාධනා කළා. ඒ අනුව මම මා කලින් ලියා තිබූ ගීතත් තවත් අලුත් ගීතත් එක්කර අතුරු මිතුරු නමින් සංගත තැටියක් නිර්මාණය කළා.

ළමයින්ට ගායනා කරන්න සුදුසු අලුත් ළමා ගීත නැතිකමේ අඩුව පුරවන එකත් මගේ අරමුණක්.

**ඒක හොඳ අරමුණක්. මොකද අද ළමයින්ගේ ප්‍රසංග වලදි දරුවන් ගායනා කරන්නෙත් වැඩිහිටියන්ගේ ගීත . මේ ගීත සමහර වෙලාවට ළමයින්ට ගැළපෙන්නෙම නැතී ඒවා.**
ඒක ඇත්ත. අලුතින් ළමා ගීත බිහි නොවීමත් මේකට එක හේතුවක්. ගීථ රචකයන් වශයෙන් අපි ඒ අඩුව පුරවන්න ඕනෙ කියලා මට හිතෙනවා.

**අපි පොඩි කාලේ අහපු ළමා ගීත අදටත් අපට මතකයි. මොකද ඒ කාලේ හොඳ ළමා ගීත සාහිතණයක් තිබුණා. ඒ වගේම ළමා ගීත අපට නිතර නිතර අහන්න ලැබුණා.**
අපි ආයෙම ඒ තත්වය ගොඩනගන්න උත්සාහ කරන්න ඕනෙ ශ්‍රීනාත්. මම මේ උත්සාහ කරන්නෙ මට හැකි පමණින් ඒ අරමුණ ඉෂ්ඨ කරන්න. මොකද මේ අපේ යුතුකමක් කියලා මට හිතෙනවා. අපි කුඩා කාලයේ රසවින්ද ළමා ගී වැනි ළමා ගී අපේ දරුවන්ටත් ලබා දෙන්න අපි උත්සාහ කරන්න ඕනෙ.

**ඔබේ මේ ළමා ගී නිර්මාණ සඳහා ඔබ දායක කර ගත්තේ කාවද?**
සංගීතයෙන් ෂෙල්ටන් ප්‍රේමරත්න රෝහණ වීරසිංහ වික්ටර් රත්නායක රෝහණ ධර්මකීර්ති තරුපති මුණසිංහ සහන් රන්වල වාසනා වීරකෝන් ජනක හේමන්ත සුරේෂ් මාලියද්දි ප්‍රදීප් මුතුකුඩ ආරච්චි නිර්මාලං හ්රත් පසිඳු චාමර සමන් රණබාහු යන සංගීතඥයන් සහ ගායනයෙන් නිරෝෂා විරාජිනී රෝහණ ධර්මකීර්ති නන්දා මාලිනී සරිනි දිසානායක තිසල් වන්සප හංසිකා සඳලි මනීෂා විජේකෝන් හෂිනි ඉලංගරත්න ඇතුළු මෙහේ ඉන්න ළමා ගායක ගායිකාවන් රැසක් මේ නිර්මාණ වලට දායක වෙනවා.

**මේ සංගත තැටිය එළි දැක්වුයේ කවදාද?**
පසුගිය කාලයේ මම ලංකාවට ගිය අවස්ථාවේ මේ සංගත තැටිය අවසන් කර මගේ මෑණියන්ට පිළිගැන්නුවා. ඇය ඒ අවස්ථාවේ සිටියේ අසනීපයෙන්. මම මේ ගීත ගැන ඇයත් සමග සාකච්ඡා කළා. ඇගේ විශාල අසාවක් තිබුණා මගේ මේ



නිර්මාණ එකතුව දැකගන්න. ඒ නිසා ඇය අප අතරින් වෙන්ව යන්න පෙර මේ සංගත තැටිය ඇගේ අතට දෙන්න ලැබීම මට විශාල සතුටක්.

මේ සංගත තැටිය නිල වශයෙන් එළි දක්වන්න මම "අතුරු මිතුරු" නමින් ප්‍රසංගයක් සංවිධානය කරනවා.

**"අතුරු මිතුරු" ප්‍රසංගය පිළිබඳ විස්තර කළොත්**
මේ ප්‍රසංගය පැවත්වෙන්නේ මාර්තු මාසයේ 18 වන දා සවස 5 ට. මම අදහස් කරගෙන ඉන්නවා මෙහේ ඉන්න අපේ දරු දැරියන් රැසක් මෙයට දායක කරගන්න.

**ඒකට විශේෂ හේතුවක් තියෙනවද?**
විශේෂ හේතු කීපයක් තියෙනවා. එකක් තමයි මේ සංගත තැටියට ගීත ගායනා කළ බොහෝ දරු දැරියන් ඉන්නෙ ඕසට්‍රේලියාවේ. ඒ එක්කම අපට තේරෙන දෙයක් තමයි ලංකාවට ගියාම ලංකාවෙ ළමයින්ගෙන් කලාව සාහිත්‍යය භාෂාව

## මුහුණට මුහුණ

### ශ්‍රීනාත් මද්දුමගේ

කෙමෙන් කෙමෙන් ගිලිහිලා යමින් තිබෙන බව. නමුත් මෙවන් රටවල ඉන්න වැඩිහිටියන් සහ දෙමාපියන්ගේ දැඩි කැපවීම මත අපේ ළමයි තවමත් අපේ කම රැකගන්න උත්සාහ කරනවා. අනිත් එක ඒ අයගේ දක්ෂතාවන් පෙන්නන් තිබෙන අවස්ථා හරිම විරළයි. ඉතින් මම හිතනවා මේ සංගත තැටිය එළි දක්වන දවසේ අපේ ළමයින්ටත් ඒ අයගේ දක්ෂතා පෙන්නන්න මෙය වේදිකාවක් කරදෙන්න.

**මේ ප්‍රසංගයේ සැකැස්ම කොහොමද?**
මේ ප්‍රසංගය සංවිධානය කරන්නේ අපේ දරු දැරියන්ට සිය දක්ෂතා ප්‍රදර්ශනය කරන්නට විශාල ඉඩක් ලැබෙන ආකාරයටයි. ඉතා සතුටුයි කියන්න දේ දරු දැරියන්ගේ දස්කම් දකින විට මේ ප්‍රසංගය ඉතාම රසවත් එකක් වන බවට අපේ හිතේ විශාල විශ්වාසයක් තිබෙනවා.

මට මේ ප්‍රසංගය සාර්ථක කරගන්නට සහය දෙන සැමටම මගේ ස්තුතිය පුද කරන්න කැමතියි.

ගි පද රචනයේ නව මං සොයා යන යාත්‍රිකයකු වන සිසිර දිසානායක අපට මතක සිටින නිර්මාණ රැසක් අපට දායාද කළ කලාකරුවෙකි. ඔහුගේ "අතුරු මිතුරු" එතෙර මෙතෙර ළමා ගී සංගත තැටියද එවන් සුවිශේෂී නිර්මාණයක් වන බවට විවාදයකි නැත. මාර්තු 18 වන දින පැවැත්වෙන "අතුරු මිතුරු" ප්‍රංගය ද කලකින් අපට දකින්නට නොලැබෙන ආකාරයේ විශිෂ්ට ප්‍රසංගයක් බව නිසැක ය. ඔබත් ඒ අත්දැකීම විඳගන්නට සහභාගි විය යුතු යයි අපට සිතේ. සිසිරට අපේ සුබ පැතුම්.